මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :PRE/2024/92 2024.09.18

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

### මැතිවරණ ප්‍රචාරක කටයුතු තහනම් නිහඬ කාල සීමාව

ඡන්ද විමසීමට පැය හතලිස් අටකට (48) පෙර එනම් 2024.09.18 දින මධ්‍යම රාත්‍රී 12.00 ට පසු ජනාධිපතිධුර අපේක්ෂකයන්ගේ සියලුම මැතිවරණ ප්‍රචාරක කටයුතු අවසන් කළ යුතු වේ.

ඒ අනුව 2024.09.18 දින පවත්වන අවසන් දේශපාලන ප්‍රචාරක රැස්වීම්වල වීඩියෝ දර්ශන හා විස්තර 2024.09.19 දිනය තුළ එක් එක් රූපවාහිනී/ ගුවන්විදුලි නාලිකාවේ එක් ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයක පමණක් ප්‍රචාරය කිරීමට හා 2024.09.19 දින පළ කරනු ලබන ප්‍රවෘත්ති පත්‍රවල ඡායාරූප හා රැස්වීම් වාර්තාව පළ කිරීමට ක්‍රියා කරන ලෙස දන්වා සිටිමි. මෙම කොන්දේසි එක් එක් නාලිකාවේ හා ප්‍රවෘත්ති පත්‍රවලට අනුබද්ධ සමාජ මාධ්‍ය හා සෙසු සියලුම සමාජ මාධ්‍ය වේදිකා පරිපාලකවරුන්ට ද අදාළ වේ. එසේම මෙම අවසන් ප්‍රචාරක රැස්වීම් විස්තර ප්‍රසිද්ධ කිරීමේ දී සියලුම අපේක්ෂකයන්ට සම අවස්ථා ලැබෙන පරිදි පුවත්පත්වල ඉඩකඩ හා නාලිකාවල හා විකාශ කාල වෙන් කිරීම කළ යුතු බව ද දන්වා සිටිමි.

තවද, 2024.09.19 දින සියලුම රූපවාහිනී නාලිකාවල දවසේ පුවත්පත් සිරස්තල ඉදිරිපත් කිරීමේ දී දෛනික පුවත්පත්වල පුවත් සිරස්තලය පමණක් ඉදිරිපත් කිරීම කළ යුතු අතර ප්‍රවෘත්තියට අදාළව වෙනත් කිසිදු අදහසක්/ යෝජනාවක් හෝ ප්‍රවෘත්තියට පටහැනි අදහසක් එය ඉදිරිපත් කරන මාධ්‍යවේදීන් විසින් සිදු නොකළ යුතු අතර එදිනට පසුව එනම්, 2024.09.20 හා 21 දිනවල පුවත් සිරස්තල ඉදිරිපත් කිරීමේ දී ද කිසිදු දේශපාලන ප්‍රචාරක ප්‍රවෘත්තියක් පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය හෝ අගතියට පත්වන ආකාරයේ ඉදිරිපත් කිරීමක් සිදු නොකරන ලෙස සියලුම මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය නාලිකා ප්‍රධානීන්, ප්‍රවෘත්ති අංශ ප්‍රධානීන්, ප්‍රවෘත්ති සංස්කාරකවරුන්, කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කර්තෘවරුන් හා සියලුම සමාජ මාධ්‍ය හිමිකරුවන් වෙත වැඩිදුරටත් නිවේදනය කරමි.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්